මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
**Public Service Commission of Central Provincial Council**

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244,கடுகஸ்தொட்டைவீதி,கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: *www.psc.cp.gov.lk*
e-mail: *psc.cp.gov@gmail.com*

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කාර්යාලය<br>காரியாலயம்<br>Office | 081-2213097 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 081-2213096 | සහකාර ලේකම්<br>உதவிசெயலாளர்<br>Asst. Secretary | 081-5631321 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 081-2213096<br>081-2213082 |

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | CPC/PSC/ 6/6 (2021) | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2021.03. 19 |

මධ්‍යම පළාත් සභාවේ,
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියළුම දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන් වෙත,

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ (සිවිල්/ සැලසුම්/ විදුලි/ යාන්ත්‍රික)**
**I වන හා II වන දෙපාර්තමේන්තු පරීක්ෂණ - (2014 – 2017)**
**(දෙපාර්තමේන්තු නීති හා රෙගුලාසි විෂය)**

මාගේ අංක CPC/PSC/6/6 (2018) දරණ 2018/11/05 දිනැති ලිපිය මගින් කැඳවා ඇති උක්ත පරීක්ෂණයන් හි 'දෙපාර්තමේන්තු නීති හා රෙගුලාසි' විෂයය සඳහා අයදුම් නොකරන ලද අයදුම්කරුවන්ට ඒ සඳහා තවදුරටත් අවස්ථාව ලබා දීමට මෙයින් අයැදුම්පත් කැඳවනු ලැබේ.

02. එබැවින් ඉහත පරීක්ෂණයන් සඳහා මේ වනවිට අයැදුම්කර නොමැති, එහෙත් පරීක්ෂණයන් සඳහා පෙනී සිටීමට බලාපොරොත්තුවන, ඔබ ආයතනය යටතේ සේවයේ නියුතු මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I වන හා II වන දෙපාර්තමේන්තු පරීක්ෂණවලට අදාළ 'දෙපාර්තමේන්තු නීති හා රෙගුලාසි' විෂය සඳහා පෙනී සිටීමට නියමිත අයැදුම්කරුවන් ඇත්නම් එම අයගේ අයැදුම්පත් ඇමුණුම 01 හි ඇතුළත් ආදර්ශ ආකෘතිය ප්‍රකාරව සම්පූර්ණ කොට ලබාගෙන **2021.04.09** දින හෝ ඊට පෙර 'ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර' යන ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් යොමු කරන මෙන් කාරුණිකව දන්වමි.

03. මෙම පරීක්ෂණය සඳහා අයැදුම්පත් කැඳවූ පළමු අවස්ථාවේදී අයැදුම්පත් එවා ඇති නිලධාරීන්ගේ ලැයිස්තුවක් මෙම කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.cp.gov.lk හි ප්‍රසිද්ධ කර ඇති අතර එම නිලධාරීන් නැවත අයැදුම්පත් එවීම අවශ්‍ය නොවන බව ද, වර්තමාන සේවා ස්ථානය වෙනස් වී ඇත්නම් හෝ ඉදිරිපත්වන විභාගයන් වෙනස්වී ඇත්නම් පමණක් ඒ බව මා වෙත දැනුම් දීම ප්‍රමාණවත් වන බව ද කාරුණිකව දැනුම් දෙමි.

04. 2013/06/01 දිනට පෙර පත්වීම ලබා ඇති මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධාරීන් හට I වන දෙපාර්තමේන්තු පරීක්ෂණයට අදාළ 'දෙපාර්තමේන්තු නීති හා රෙගුලාසි' ප්‍රශ්න පත්‍රයට මෙන්ම II වන දෙපාර්තමේන්තු පරීක්ෂණයට අදාළ 'දෙපාර්තමේන්තු නීති හා රෙගුලාසි' යන ප්‍රශ්නපත්‍ර දෙකටම පෙනී සිටීමට අයැදුම් කළ හැකිය. ඒ අනුව ඇමුණුම 01හි ආදර්ශ අයැදුම්පත අදාළ පරිදි සම්පූර්ණ කොට එවීම මගින් ප්‍රශ්න පත්‍ර දෙකටම පෙනී සිටීමට ඔවුන්ට හැකිවේ. එසේ වුවද දෙපාර්තමේන්තු පරීක්ෂණ පාදක කරගනිමින් ලබාදෙන උසස් කිරීම් හා ස්ථිර කිරීම්වලදී එම කටයුතු අදාළ සේවා ව්‍යවස්ථා/ විධිවිධාන අනුව සිදුකෙරෙනු ඇත.

05. මෙම එක් එක් විභාගය සඳහා පළමු වරට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවෙන් නිදහස් කරනු ලැබේ. ඉන්පසු ඉදිරිපත්වන අවස්ථාවක් නම් පහත සඳහන් පරිදි විභාග ගාස්තු වශයෙන් ගෙවිය යුතුය. ඒ අනුව,

- I වන දෙපාර්තමේන්තු පරීක්ෂණයේ 'දෙපාර්තමේන්තු නීති හා රෙගුලාසි' විෂය පමණක් - රු.300/=
- II වන දෙපාර්තමේන්තු පරීක්ෂණයේ 'දෙපාර්තමේන්තු නීති හා රෙගුලාසි' විෂය පමණක්- රු.300/=
- I වන දෙපාර්තමේන්තු පරීක්ෂණයේ 'දෙපාර්තමේන්තු නීති හා රෙගුලාසි' විෂය හා II වන දෙපාර්තමේන්තු පරීක්ෂණයේ 'දෙපාර්තමේන්තු නීති හා රෙගුලාසි' විෂය - රු.400/=

06. මෙම විභාග ගාස්තු මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්ගේ **20.03.02.13** ආදායම් ශීර්ෂයට බැර වනසේ මධ්‍යම පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා අදාළ මුදල් කුවිතාන්සිය (නිල් පැහැති කුවිතාන්සිය) අයදුම්පත්‍රයේ නියමිත කොටසේ නොගැලවෙනසේ ඇලවිය යුතුය.

07. අසම්පූර්ණ, නියමිත දිනට නොලැබෙන හා නියමිත ප්‍රශ්න පත්‍රයට පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන්ගේ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

ටී.ඒ.ඩී.ඩබ්ලිව්. දයානන්ද
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

# මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ (සිවිල්/සැලසුම්/විදුලි/යාන්ත්‍රික)

## I වන හා II වන දෙපාර්තමේන්තු පරීක්ෂණ - (2014 – 2017)

## (දෙපාර්තමේන්තු නීති හා රෙගුලාසි)

විභාගයට පෙනී සිටීමට බලාපොරොත්තු වන භාෂා මාධ්‍යය:-

(අදාළ කොටුවේ " √ " සළකුණ යොදන්න.)

| | |
|---|---|
| සිංහල | |
| දෙමළ | |
| ඉංග්‍රීසි | |

| |
|---|
| විභාග අංකය: |
| (කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා) |

---

**01.** අයදුම්කරු දැනට සේවය කරන දෙපාර්තමේන්තුව/ආයතනය: ....................................................

..........................................................................................................................................

**02.** i. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්):- ....................................................

..........................................................................................................................................

ii. මුලකුරුවලින් කියවෙන නම් (ඉංග්‍රීසියෙන්):- ..............................................................................

..........................................................................................................................................

iii. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම (සිංහලෙන්/දෙමළෙන්):- ..........................................

..........................................................................................................................................

iv. මුලකුරුවලින් කියවෙන නම් (සිංහලෙන්/දෙමළෙන්):- ..........................................................

..........................................................................................................................................

v. ජාතික හැඳුනුම්පත් අංකය:-

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

**03.** i. කාර්යාලයීය ලිපිනය (ඉංග්‍රීසියෙන් - ප්‍රවේශපත්‍ර එවීම සඳහා):- ..........................................

..........................................................................................................................................

ii. පෞද්ගලික ලිපිනය :- ..........................................................................................................

..........................................................................................................................................

iii. දුරකතන අංකය :- කාර්යාලය: ............................. පෞද්ගලික: .................................

**04.** අයදුම්කරන පරීක්ෂණය/ පරීක්ෂණ:- (අදාළ කොටුව/ කොටු තුළ " √ " සළකුණ යොදන්න.)

| | |
|---|---|
| I වන දෙපාර්තමේන්තු පරීක්ෂණය | |
| II වන දෙපාර්තමේන්තු පරීක්ෂණය | |

**05.** සේවා විස්තර:-

i. දැනට දරණ තනතුර:- ....................................................................

ii. පන්තිය හා ශ්‍රේණිය:- ....................................................................

iii. මුල් පත්වීම් ලිපියේ අංකය:- ........................................................ දිනය:- ........................

iv. පත්වීම ස්ථිර කරන ලද දිනය:- ........................................

v. වැටුප් බණ්ඩය:- ........................................

vi. I වැනි දෙපාර්තමේන්තු පරීක්ෂණයට පෙනී සිට සමත්ව ඇත්ද? ............................................

vii. ඉහත vi සඳහා පිළිතුර 'ඔව්' නම්, එම පරීක්ෂණයේ නම:- ....................................................

..........................................................................................................................................

viii. එම පරීක්ෂණය පැවැත්වූ දිනය:- ..............................................................................

ix. II වැනි දෙපාර්තමේන්තු පරීක්ෂණයට පෙනී සිට සමත්ව ඇත්ද? ..........................................

x. ඉහත ix සඳහා පිළිතුර 'ඔව්' නම්, එම පරීක්ෂණයේ නම:- ..................................................

.................................................................................................................................

xi. එම පරීක්ෂණය පැවැත්වූ දිනය:- ........................................................................................

**06.** i. මෙම විභාගය සඳහා පෙනී සිටිනු ලබන වාරය:- ......................................................

**07.** විභාග ගාස්තු:-

| |
|---|
| මුදල් කුවිතාන්සිය මෙහි අලවන්න. |

i. මෙම අයැදුම්පතේ මවිසින් දක්වන ලද සියළුම විස්තර මාගේ දැනුමේ පමණින් සත්‍ය බවත් නිවැරදි බවත් ප්‍රකාශ කර සිටිමි

ii. මම විභාග ගාස්තු වශයෙන් රු. .................. ක මුදලක් ........................... වන දින .................................. කාර්යාලයට ගෙවූ බවත් ඊට අදාළ .......................... අංක දරණ කුවිතාන්සිය මෙහි අලවා ඇති බවත් සඳහන් කරමි.

iii. මම මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලැබූවකු නොවන බව විභාගයට පෙර හෝ ඉන් පසුව හෝ අනාවරණය වුවහොත් කොමිෂන් සභා ලේකම්වරයාට මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඇති අයිතිය හා බලය අවිවාදයෙන් පිළිගනිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් කොමිෂන් සභා ලේකම්වරයා විසින් පනවනු ලබන නීති රීති වලට මම එකඟ වෙමි.

.................................... ................................................

දිනය අයැදුම්කරුගේ අත්සන

## <u>ආයතන ප්‍රධානියාගේ සහතිකය</u>

ඉහත සඳහන් ........................................................නම් නිලධාරියා විසින් මෙම අයැදුම්පතේ අංක 02, 03, 04 හා 05 යන ඡේද වල දක්වා ඇති විස්තර පෞද්ගලික ලිපිගොනුව අනුව සත්‍ය බවත්, අයැදුම්කිරීම සඳහා සුදුසුකම් ලබාඇති නියමිත විභාගය සඳහා අයැදුම් කර ඇති බවත්,මෙම විභාගයට අදාළ කොන්දේසි හා ව්‍යවස්ථා යටතේ මෙම විභාගයට පෙනී සිටීමට ඔහු/ඇය සුදුසුකම් ලබා ඇති බවත් සහතික කරමි.

......................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

ආයතනය:- ......................................................................

දිනය:- ...........................................